# සිංහල හා දෙමළ ඉතිහාස - I

මෙරට දෙමළ ජනයාගේ ඉතිහාසය ඇරඹෙන්නේ කවදා ද? ඇතැම් දෙමළ ජාතිවාදීන් නිර්මාණය කර ඇති ඉතිහාසයට අනුව මෙරට දෙමළ ජනයාගේ ඉතිහාසය සිංහලයන්ගේ ඉතිහාසයට වඩා ඈතට යයි. පේරාදෙණියෙන් බිහි වූ මයිකල් රොබට්ස් නම් කලක් ඉතිහාසය ඉගැන්වූ පුද්ගලයා ද එහි යම් සාධාරණත්වයක් දකියි. ඉතිහාසය ද අනෙක් දැනුම මෙන් ම මිනිසුන්ගේ නිර්මාණයකි. එහෙත් ඕනෑම අයකුට ඕනෑම දෙයක් දැනුම ලෙස නිර්මාණය කළ නො හැකි ය. තමන් නිර්මාණය කරන දැනුම වෙනත් දැනුම්, සාධක ආදිය සමග සංගත බවට නිර්මාපකයා වග බලාගත යුතු ය. මම විශ්වවිද්‍යාලයකින්, විශේෂයෙන් ම පේරාදෙණියෙන් හෝ කොළඹින් හෝ ඉතිහාසය ඉගෙන නොගත්තෙමි. ඉතිහාසය ගැන ලිවීමට මට ඇති හොඳම සුදුසුකම එය යැයි පරපුටු ඉතිහාසයක් හැදෑරූ තමන් වැනි අයට පමණක් ඉතිහාසය ගැන ලිවීම සීමාවිය යුතු යැයි සිතන මයිකල් රොබට්ස් වැන්නවුන්ට කිවයුත්තේ එනයින් පරපටු ඉතිහාස සම්ප්‍රදායක මා කොටු නොවන බව ද සඳහන් කරමිනි. බටහිර අධ්‍යාපනයක් ලැබූ ඊනියා විශේෂඥයන් බොහෝ විට සිතන දෙයක් නම් තම තම ක්ෂේත්‍රවල උරුමක්කරුවන් පොල්මෑකරුවන් තමන් පමණක් ම බව ය. ඇතැම් සාහිත්‍යකරුවන් ද එසේ කියන බව මම දනිමි. එහෙත් මේ බොහෝ අයගේ කුහක වතක් ඇත. යමකු ඔවුන් අසන්නට කැමති දේ කියනතාක් ඒ අය තම ක්ෂෙත්‍රය හදාරා ඇත් ද නැත් ද යන්න ඔවුන්ට ප්‍රශ්නයක් නො වේ. විශ්වවිද්‍යාල විසින් මට ලබා දෙන ලද ගණිත විද්‍යා සම්ප්‍රදායෙන් කැඩීමට මට බොහෝ කලක් ගතවූ බව පමණක් මෙහි දී සඳහන් කරමි.

මහාවංසයට අනුව සිංහලයන්ගේ ඉතිහාසය විජය රජුගෙන් ඇරඹෙයි. ආචාර්ය ශිරාන් දැරණියගල මහතාට අනුව අප අර්ධ වෛදිකයන් යනුවෙන් හඳුන්වන පිරිස ලංකාවට පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව නවවැනි සියවසේ දී පමණ ය. ඒ විජය කුමරු පැමිණියේ යැයි කියන වකවානුවට වසර තුන්සියයකට පමණ පෙර ය. සිංහලයන් යනු ඒ අර්ධ වෛදිකයන් හා එවකට ලංකාවේ විසූ බොහෝ ගෝත්‍ර සම්මිශ්‍රණය වී නිර්මාණය වූ ජාතියක් යැයි අපි කියමු. ඒ ජාතිය ගොඩනැගීමේ සංසිද්ධිය පඬුඅබා කල සිදුවිණි යැයි ද අපි අදහස් කරමු. සිංහල ජාතියට එකතු නොවූ ගෝත්‍රය වැදි ගෝත්‍රය පමණක් වුව ද යක්ෂයන්ගේ ද පූර්ණ සහයෝගය ජාතිය ගොඩනැගීමට ලැබී නොමැති බව වංසකතාවලින් මෙන් ම පුරාවෘත්තවලින් ද පැහැදිලි වෙයි. පඬුඅබා කුමරුට යක්ෂ ගෝත්‍රික සමහරුන්ගෙන් සහාය ලැබී ඇති බව පැහැදිලි ය. චිත්‍රරාජ, කාලදේව වැනි නායකයෝ ද වාලම්බී වැනි නායිකාවෝ ද ඒ අතර වූහ. බොහෝ යක්ෂයන්ගෙන් සිංහල ජාතිය ගොඩනැගීමට විරුද්ධත්වය එල්ලවද්දී චිත්‍රරාජගෙන් ලැබුණු සහාය අගය කිරීමට පඬුඅබා රජු ඔහුට ඇතැම් අවස්ථාවල සමඅසුන් දී ඇති බව සිතාගත හැකි ය. අද දේශපාලනයෙහි දී ද එවැනි සංකේතාත්මක ප්‍රදර්ශන දැකිය හැකි ය. චිත්‍රරාජ තම පියා නිසා පඬුඅබා රජු ඔහුට සමඅසුන් දුන්නේ යැයි කියන්නෝ රජවරු නොහඳුනති. රජවරු බොහෝ විට තම පියා ජීවත්ව සිටින්නේ නම් ඔහු රාජසභාවෙන් හැකිතාක් ඈතින් තැබීමට උත්සාහ කරති. යක්ෂයන්ට සිංහල ජාතියට ඇතුල්වීමට සියවස් ගණනාවක් ගිය බව ගැමුණු කුමරු කල පමණක් නොව මහසෙන් කසුප් රජවරුන්ගේ කාලවල  සිද්ධීන්ගෙන් ද පැහැදිලි වෙයි. පඬුඅබා කුමරු කුඩා කල යක්ෂ ගම්මානයක හැදී වැඩී ඇති බව පැහැදිලි ය. එහෙත් ඔහු එපමණකින් යක්ෂ කුමරකු වන්නේ නො වේ. පඬුඅබා ගොඩනැගූ ජාතිය සිංහ වංශය මුල්කරගෙන නම්කිරීමෙන් හා යක්ෂයන්ට මුළුමනින් ම ඒ ජාතියට ඇතුල්වීමට සියවස් ගණනක් ගතවීමෙන් පෙන්නුම් කරන්නේ ද පඬුඅබා කුමරුගේ සිංහ සම්භවය හා යක්ෂයන් මුල දී සිංහල ජාතියට එරෙහි වීම ය. පඬුඅබා කුමරුට ශාක්‍ය සම්බන්ධයක් ද වූ බව මෙයින් බැහැර නො කෙරෙයි.

දඹදිවින් මෙරටට අර්ධ වෛදිකයන් පැමිණීමට පෙර මෙරට සිටි ගෝත්‍රිකයන් විශාල පිරිසක් කලකට පසු තම අනන්‍යතාව නැතිකරගෙන ඇත. ගැමුණු රජු කාලයෙහි ද නාග මාණවිකාවන් ගැන සඳහන් වීමෙන් පෙන්නුම් කරන්නේ එකල ද නාගයන්ගෙන් යම් පිරිසක් වුවත් තම අනන්‍යතාව රැකගෙන සිටි බව ය. එහෙත් කල් යෑමේ දී ඔවුන්ගේ අනන්‍යතාව නැතිව ගොස් ඇති බව පැහැදිලි ය. සිංහල ජාතිය ගැන කතාකිරීමේ දී අපේ අවධානයට ලක්විය යුතු වැදගත් ප්‍රශ්න දෙකක් වෙයි. සිංහල ජාතියෙහි සංස්කෘතියෙහි ප්‍රධාන ලක්ෂණ ලැබුණේ කිනම් ගෝත්‍රයකින් ද, වංශයකින් ද යන්න පළමු ප්‍රශ්නය වෙයි. දෙවැන්න සිංහල ජාතියට එකතු නොවීමට වැදි ගෝත්‍රිකයන් ගෙන ඇති තීරණය සම්බන්ධව ය. මේ ලිපියෙන් ඒ ප්‍රශ්නවලට පූර්ණ පිළිතුරු දීමට හැකි කමක් නැත. එයට හේතුව අප තවමත් ඒ කරුණු අධ්‍යයනය කිරීම ය. එහෙත් අපට දැනටමත් ඒ සම්බන්ධව ඇතැම් ඉඟි පළ කළ හැකි ය. විජය කුමරුගෙන් සංකේතාත්මක ව කියැවෙන මෙරටට පැමිණි අර්ධ වෛදිකයන් අතර විවිධ ගෝත්‍ර හා වංශ තිබී ඇති බව පැහැදිලි ය.

© Prof. Nalin De Silva

මේ ගෝත්‍ර හා වංශ අතර ශාක්‍යයන් ද සිටි බවත් පැහැදිලි ය. එහෙත් ඒ සියල්ලන්ගෙන් වඩාත් බලසම්පන්න වී ඇත්තේ සිංහ වංශය ය. සිංහ වාංශිකයන් හා ශාක්‍ය වාංශිකයන් අතර මෙන් ම වෙනත් වාංශිකයන් හා ගෝත්‍රිකයන් අතර ද ආවාහ විවාහ කෙරී ඇත. ගෝත්‍ර හා වංශ විවිධ වුව ද දඹදිවින් පැමිණි අර්ධ වෛදිකයන්ගේ සංස්කෘති අතර විශාල වෙනස්කම් තිබිණි යැයි කිව නො හැකි ය. එවැනි වෙනස්කම් තිබිණි නම් ඒ අද මහාරාෂ්ට්‍ර යැයි කියැවෙන දඹදිව බටහිර වෙරළින් පැමිණි අය හා වංග කාලිංග වැනි නැගෙනහිර පෙදෙස්වලින් පැමිණි අය අතර විය යුතු ය. විජය කුමරු පැමිණි නැව දඹදිව නැගෙනහිර වෙරළින් පිටත්ව බටහිර වෙරළේ ද නැංගුරම් ලා පැමිණියේ ය යන මහාවංස පුවතින් කියැවෙන්නේ මේ දෙපැත්තන් ම දඹදිවින් ලංකාවට පැමිණ ඇති බව ය. නැගෙනහිරින් පැමිණි අය අර්ධ වෛදිකයන් ද බටහිරින් පැමිණි අය වෛදිකයන් ද වන්නට ඇත. ඒ එසේ නම් බලවත් පිරිස මෙන් ම වැඩි පිරිස ද වී ඇත්තේ අර්ධ වෛදිකයන් බව ද පැහැදිලි ය. එහෙත් ඒ එසේ නොවන්නට ඇති ඉඩකඩ වැඩි යැයි සිතමි. දඹදිව බටහිරින් ද මෙරටට පැමිණ ඇත්තේ අර්ධ වෛදිකයන් විය හැකි ය. ඔවුන් පැමිණෙන්නට ඇත්තේ නැගෙනහිරින් අර්ධ වෛදිකයන් පැමිණෙන්නට කලකට පෙර විය හැකි ය. අර්ධ වෛදිකයන් දඹදිවින් මෙරටට පැමිණියේ එහි වෛදික ආක්‍රමණය උත්සන්න වීමත් සමග ද? එකල දඹදිවින් මෙරටට සංක්‍රමණය වීමට තිබූ හේතුව කුමක් ද? විජය ද කැරළි ගැසුවේ වෛදික ආක්‍රමණයට විරුද්ධව ද? වෛදික සංස්කෘතික ආක්‍රමණය බටහිරින් නැගෙනහිරට ගලා යෑමට ටික කලක් ගතවන්නට ඇත. රාමායනයෙන් කියැවෙන්නේ වෛදික සංස්කෘතික ආක්‍රමණය දඹදිව වින්ධ්‍යා කඳුවැටියෙන් දකුණට ගලා ගිය ආකරය බව පැහැදිලි ය.

මේ දෙකොටස හැරෙන්නට දකුණු දඹදිවින් ද මෙරටට අර්ධ වෛදිකයන් පැමිණ ඇත. විශේෂයේ ම මදුරා නගරය මෙහි දී අපේ අවධානයට හොමු විය යුතු ය. උතුරු, නැගෙනහිර හා ඊශාන දඹදිවින් පළා ආ ඇතැම් පිරිස් මදුරා නගරය හා අවට පදිංචි වී ඇති බව ප්‍රකට කරුණකි. මොවුන්ගෙන් මුල් පිරිසක් උතුරු දඹදිව අපේ සාහිත්‍යයෙහි සුප්‍රසිද්ධ මථුරා නගරයෙන් පළා ආ අය විය යුතු ය. ඔවුන් ද පළා එන්නට ඇත්තේ යම් ආකාරයක වෛදිකකරණයකට විරුද්ධව යැයි සිතිය හැකි ය. ඔවුන් තමන් පදිංචි වූ දකුණු දඹදිව නගරය ද මදුරා නමින් ම හඳුන්වන්නට ඇත. පසුව ඒ ද්‍රවිඩකරණයට ගොදුරු වී මදුරෙයි වී ඇත්තේ ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත්වල මෑතභාගයෙහි දී ග්‍රාම නාම ද්‍රවිඩකරණයට ලක්කෙරී ඇති ආකාරය අනුව ය. ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ, කැනඩාවේ බොහෝ නගර හා ප්‍රදේශ නම්කර ඇත්තේ එංගලන්තයේ හා අයර්ලන්තයේ නගර නමින් වීම පමණක් නොව මෙරට හැටන් ආදී නගර ද වතුවල භෝග වැවීමට පැමිණි අය කලින් ජීවත් වූ ස්කොට්ලන්තයේ නගර නමින් හඳුන්වා තිබීම සමග මදුරා සංසන්දනය කරන්න. මදුරා රාජ්‍යයෙහි රජවරු පාණ්ඩ්‍ය (පඬු) වංශයට අයත්වූහ. ඔවුහු අර්ධ වෛදිකයෝ වූහ. පාණ්ඩ්‍යයන් ද්‍රවිඩයන් වන්නට ඇත්තේ පසුව ය. විජය රජුට ගෙනා මනාලිය ද්‍රවිඩ නොවන්නේ එබැවිනි. ද්‍රවිඩයන් දඹදිවට (භාරතයට - භාරතය යනු වෛදිකකරණය වූ දඹදිව ලෙස සැලකිය හැකි ය) පැමිණ ඇත්තේ ක්‍රිස්තු පූර්ව හයවැනි සියවසේ පමණ ය. ඔවුන්ගේ මුල්බිම (නිජභූමිය) පිළිබඳ විවිධ ප්‍රශ්න ඇතත් ඔවුන් දඹදිවට පැමිණි කාලය පිළිබඳ ප්‍රශ්න ඇත්තේ දෙමළ හා වඩාත් පළල්ව ගතහොත් ද්‍රවිඩ ජාතිවාදීන්ට ය.

යක්ෂ ගෝත්‍රිකයන් මෙරටට පැමිණියේ කවදා ද? ඔවුන් හා වැදි ගෝත්‍රිකයන් අතර ඇති සම්බන්ධය කුමක් ද? යක්ෂ හා වැදි ගෝත්‍රවලට සිංහල ජාතියට ඇතුල්වීමට අවශ්‍යතාවක් නො වූයේ ඇත්තට ම ඔවුන් එයට විරුද්ධවූයේ ඇයි? යක්ෂගෝත්‍රිකයන් මුළුමනින් ම සිංහල වීමට අවුරුදු දාහක් පමණ ගත්තේත් වැදි ගෝත්‍රිකයන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බලපෑම යටතේ මෑතක දී සිංහල වන තුරු (අද ඔවුහු නාමික ව වැදි ගෝත්‍රයට අයත් වෙති.) සිංහල ජාතියට ඇතුල් නොවූයේත් ඇයි? රාජ්‍ය නොවන මෙරට හා පිටරට පඬියන් ඔවුන් ආදිවාසීන් ලෙස හැඳින්වීමේ භයානක විපාකය කුමක් ද? ආදිවාසියා යන පදය යෙදෙන්නේ යම් රටකට පිටතින් පැමිණ දේශපාලන ආධිපත්‍යය පිහිටුවන පිරිසක් එහි පැමිණෙන විටත් එරට වාසය කළ ජනතාවකට ය. එහෙත් ඒ අනිවාර්ය මිස ප්‍රමාණවත් අවශ්‍යතාවක් නො වේ. පිටින් එන පිරිස ඇතැම්විට එවකටත් වාසය කළ ජනතාවගෙන් විශාල පිරිසක් ඝාතනය කරති. ආදිවාසියා යන පදය අද යෙදෙන්නේ ඇමරිකාවේ, ඕස්ට්‍රේලියාවේ නවසීලන්තයේ ඉංගිරිසින් එහි පැමිණෙන විට විසූ ජනයාට ය. 1053 දී නෝමන් ආක්‍රමණයෙන් පසු ඉංගිරිසි ජාතිය බිහිවීම ඇරඹිණි. එවකට එංගලන්තයේ සිටි සැක්සන්වරු ආදිවාසීන් ලෙස නො හැඳින්වෙති. වැදි ජනයා ආදිවාසීන් ලෙස හැඳින්වෙන්නේ කිනම් පදනමකින් ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva